All Rights Reserved

නාට්‍ය හා රංග කලාව - I

Name: - ..... Class: -..... Index no: - .....

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය කාණ්ඩ ඇසුරින් 1 සිට 4 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A.
රුදුරු මරු යකා මුගුරක් ගෙන — අතට
විදුරු තරු දෙකා මෙන් නෙත් රැවිය — මට
ඇදුරු වරු දැකා නර බිල්ල — ගන්නට
පැදුර පිට තැබුවා යකුට — කන්නට

B.
(a) මොකක්ද හුච්චි අම්මා
(b) මරක්කල ආච්චියෙක් නෙමෙයි ඒ විලාසෙ බන්
(a) අක්කණ්ඩි
(b) වට්ටක්කද ? බණ්ඩක්කද ? (මෙහිදී ඇය යන්නට සැරසෙයි)

C.
අන්දම් කරුවලේ සොහොනේ — සිටින්නේ
අන්දමකින් රැ සිහිනෙන් — පෙනෙන්නේ
රන්දම් යගදාව ගෙන — කරකවන්නේ
පන්දම් පාලියට සන්නිය — වරෙන්නේ

D.
(a) ඉතින්, ඉතින් ?
(b) උඟට කකුල් පහක් තිබුණා. අපි දැක්කම "ජබුක්" ගාල ගඟට පැනලා "බබුක්" ගාලා බුබුල් දාන්න පටන් ගත්තා.

01. මෙහි A B C යන පද්‍ය හා ගද්‍ය පාඨ අයත් වන්නේ,
(1) සන්නියකුමටය. (2) රටයකුමටය. (3) සූනියම් යාගයටය. (4) දෙවොල් මඩුවටය.

02. B සංවාද කාණ්ඩයෙන් කියවෙන නාට්‍යමය අවස්ථාව වන්නේ,
(1) මහාකෝල සන්නියකාගේ පැමිණීම. (2) සූනියම් යක්ෂණියගේ පැමිණීම.
(3) සන්නි පැමිණීම. (4) පාලි දොළහ පැමිණීම.

3. ඉහත A B C යන නාට්‍යමය අවස්ථා ඇතුළත් ශාන්තිකර්ම අයත් වන්නේ,
(1) උඩරට සම්ප්‍රදායට ය. (2) සබරගමු සම්ප්‍රදායට ය.
(3) පහතරට සම්ප්‍රදායට ය. (4) ද්‍රවිඩ සම්ප්‍රදායට ය.

4. ඉහත C වල සඳහන් පද්‍ය අයත් වන පාලිය වන්නේ,
(1) සළු පාලිය (2) දළුමුර පාලිය (3) කෙණ්ඩි පාලිය (4) පන්දම් පාලිය

5. "අවස්ථානු කෘතීන් නාට්‍යයම්" අවස්ථා නිරූපණය කර දැක්වීම නාට්‍ය නම් වේ යනුවෙන් පැවසුවේ,
(1) භරතමුණි (2) විශ්වනාත් පඬිවරයා (3) ඇරිස්ටෝටල් (4) ධනංජය පඬිවරයා

නෘත්ත සම්බන්ධව වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ලී කෙළි සහ සවරම් නැටුමෙහි දක්නට ලැබෙන්නේ නෘත්ත ලක්ෂණය.
(2) හිඳුණයාඩුකුල වලන සමඟ අත් පා, ඇස්, මුහුණු මගින් භාවයන් ප්‍රකාශ වන නර්තන විශේෂයකි.
(3) අභිනය මාර්ගයෙන් කිසියම අර්ථයක් ප්‍රකට වේ.
(4) මණිපුරි හා හරත නැටුම් නෘත්ත ප්‍රභේදය සඳහා නිදසුන් වේ.

17. ලෝක ධර්මී නාට්‍ය සම්ප්‍රදාය සම්බන්ධ වඩාත්ම නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) රංගනයේ දී වෙස් මුහුණ භාවිත කිරීම මෙහි සුවිශේෂී ලක්ෂණයකි.
(2) බොහෝ විට කාලීන කතා පුවත් පාදක කරගනී.
(3) රංගනය සඳහා සංගීතය අත්‍යවශ්‍ය අංගයකි.
(4) මෙම නාට්‍ය වේදිකා සැරසිලිවලින් තොරය.

18. "වේදිකාව මත නළුවා ගීතයක් ගයමින් සිට ක්ෂණයකින් ඔහු පුළුන් රොදක් මෙන් සැහැල්ලුවෙන් ඇද වැටී පෙරළී යයි" මෙම අවස්ථාව සාර්ථකව නිරූපනය කිරීමට ඔහු නියැළුණු රංග අභ්‍යාස වන්නේ පිළිවෙලින්,
(1) කටහඬ අභ්‍යාස හා තාපන අභ්‍යාසයි.
(2) සංවේදන අභ්‍යාස හා කටහඬ අභ්‍යාසයි.
(3) තාපන අභ්‍යාස සහ සංවේදන අභ්‍යාසයි.
(4) කටහඬ අභ්‍යාස සහ ශිථිලකරණ අභ්‍යාසයි.

19. රංගනය හා අධ්‍යක්ෂණය යන ක්ෂේත්‍ර දෙකින්ම නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූයේ කවුද ?
(1) සුමින්ද සිරිසේන
(2) හෙන්රි ජයසේන
(3) එදිරිවීර සරච්චන්ද්‍ර
(4) නීල් අලස්

10. කාව්‍ය ශාස්ත්‍රය ග්‍රන්ථයේ කතෘ ලෙස සැලකෙන්නේ.
(1) භරතමුණි (2) ධනංජය (3) ඇරිස්ටෝටල් (4) විලියම් ෂේක්ස්පියර්

11. රංග ක්‍රීඩාවක අරමුණක් නොවන්නේ,
(1) නළුවාගේ කය සහ මනස සමබර කිරීමයි.
(2) නළුවන් අතර තරගකාරිත්වය ඇතිකිරීමයි.
(3) නළුවා තුළ සාමූහිකත්වය ඇතිකිරීමයි.
(4) නළුවා තුළ සබකෝලය සහ බිය තුරන් කිරීමයි

12. වේදිකා නාට්‍ය අනෙකුත් කලාවන්ට වඩා සුවිශේෂී වන්නේ,
(1) ගබඩාකර තබාගත හැකි වීම.
(2) රූපරාමු සංස්කරණය කළ හැකි වීම.
(3) සෘජු ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබීම.
(4) කාලය හා අවකාශය සීමා රහිත වීම.

13. නළුවෙකු තම පෞද්ගලිකත්වය අතහැර වෙනත් භූමිකාවකට ප්‍රවේශ වීම,
(1) චරිත නිරූපණය වේ.
(2) සමාරෝපය වේ.
(3) අනුකරණය වේ.
(4) අභිනය වේ.

14. නාට්‍යමය ලක්ෂණ ඇතුලත් බෞද්ධ පූජා කර්ම අන්තර්ගත වරණය කුමක්ද ?
(1) ආලවක දමනය, දොරකඩ අස්න, මිලින්ද ප්‍රශ්නය
(2) පිරිත් පිංකම, නානුමුරය, යුගාසන බණ
(3) වඩිගපටුන, අංගුලිමාල දමනය, පාලි දොළහ
(4) සන්නියකුන්ගේ පැමිණීම, අඹ විදමන, නාලාගිරි දමනය

• පහත සඳහන් වෙස්මුහුණ ඇසුරින් 15 සිට 17 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A



B



15. A සහ B වෙස්මුහුණු යොදා කෙරෙන ශාන්තිකර්ම අයත් වන්වේ,
(1) උඩරට සම්ප්‍රදායටය. (2) සබරගමුව සම්ප්‍රදායටය.
(3) පහතරට සම්ප්‍රදායටය. (4) ඉහත සම්ප්‍රදායන් කුනටමය.

16. ඉහත A සහ B වෙස්මුහුණු පිළිවෙලින් අයත්වන්නේ.
(1) අමුක්කු සන්නියට හා කණ සන්නියටය. (2) දේව සන්නියට හා අමුක්කු සන්නියටය.
(3) ගොලු සන්නියට හා ගුල්ම සන්නියටය. (4) කණ සන්නියට හා කොර සන්නියටය.

17. ඉහත වෙස්මුහුණු භාවිතය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) කෝලම නාටකවල අපර රංගය සඳහා භාවිතා කෙරිණි.
(2) තත්කාලීන චරිත උපහාසයෙන් යුතුව නිරූපණය කිරීමට යොදා ගැනුණි.
(3) කාලීන රාජ සභා නර්තන සඳහා යොදාගෙන තිබුණි.
(4) රෝග සුව කිරීම අරමුණු කොටගෙන භාවිත කෙරිණි.

18. තම පරිකල්පන ශක්තිය මෙහෙයවා නිර්මාණය කරගන්නා චලන වන්නේ,
(1) නිර්මිත චලනය (2) ස්වභාවික චලනය
(3) තාලානුකූල චලනය (4) අභිරූපණ චලනය

19. දෘශ්‍ය කලාවලට අයත් වන්නේ,
(1) කැටයම්, ප්‍රතිමා, නාට්‍ය, සංගීතය (2) චිත්‍ර, මූර්ති, කැටයම්, ප්‍රතිමා
(3) සංගීතය, මූර්ති, සාහිත්‍ය, ටෙලිනාට්‍ය (4) චිත්‍රපට, සාහිත්‍ය, නවකථා, සංගීතය

20. නාට්‍ය පිටපතෙහි ඇති කතාව ප්‍රේක්ෂකයාට ප්‍රදර්ශනය වන්නේ,
(1) රංගාලෝකය මගිනි. (2) නළුවා මගිනි.
(3) අංගරචනය මගිනි. (4) රංගරචනය මගිනි.

21. නාට්‍ය පෙළ රචනය. රංගයක් බවට පත් කිරීමට නායකත්වය දෙන්නේ,
(1) අධ්‍යක්ෂකවරයාය. (2) වේදිකා පරිපාලකවරයාය.
(3) නළු නිළි පිරිසය. (4) රංග වින්‍යාස ශිල්පියාය.

22. නාට්‍ය කලාව ආරම්භ වීමට මග පෑදෙනුයේ,
(1) ගැමි කලාවන් නිසාය. (2) සංස්කෘතික උත්සව නිසාය.
(3) අභිචාර විධි නිසාය. (4) බෞද්ධාගම පැතිරීම නිසාය.

23. වෙනත් පුද්ගල චරිතයක් කර පෙන්වීම,
(1) සමාරෝපයයි. (2) අනුකරණයයි.
(3) අභිරූපනයයි. (4) ක්ෂණික නිරූපණයයි.

24. නළු - ප්‍රේක්ෂක සහසම්බන්ධතාවය ඉතා වැදගත් වන්නේ,
(1) ඔපෙරාවකදීය. (2) නර්තනයකදීය.
(3) මුද්‍රා නාට්‍යයකදීය. (4) වේදිකා නාට්‍යයකදීය.

25. නර්තන කලාව ඉදිරිපත් කිරීමේදී ප්‍රධාන වන අභිනය,
(1) ආහාර්ය අභිනය (2) ආංගික අභිනය (3) සාත්වික අභිනය (4) සතර අභිනය

26. නාට්‍ය හා රංගකලාවේදී ඉන්ද්‍රියන් පාලනය කර ගැනීමට ගෝචර වන අභ්‍යාසයකි,
(1) සංවේදන අභ්‍යාස (2) ශ්වසන අභ්‍යාස (3) කටහඬ අභ්‍යාස (4) ශිථිලකරණ අභ්‍යාස

27. පහත සඳහන් නාට්‍ය අතරින් නාට්‍ය ධර්මී නාට්‍ය සම්ප්‍රදායට අනුව නිෂ්පාදනය වූ නාට්‍ය කුමක්
(1) අහසින් වැටුණු මිනිස්සු (2) කැලණි පාලම
(3) විකෘති (4) මනමේ

නාට්‍ය කලාව පිළිබඳ වැරදි කියමන වන්නේ,
(1) සජීව කලාවකි. (2) සාමූහික කලාවකි. (3) විදග්ධ කලාවකි. (4) ශ්‍රව්‍ය දෘශ්‍ය කලාවකි.

නාට්‍යයක් රංගගත වන මොහොතේ දී අත්‍යවශ්‍ය පුද්ගලයන් දෙදෙනෙකි,
(1) රචක හා අධ්‍යක්ෂක (2) නළුවා හා ප්‍රේක්ෂකයා
(3) අර්ථපති හා රංගභූමි පාලක (4) පසුතල නිර්මාණ ශිල්පියා හා රචකයා

චරිතයක ඇති විවිධ පැතිකඩ,
(1) භූමිකා නම් වේ. (2) අභිරූපණය නම් වේ.
(3) අනුරූපනය නම් වේ. (4) සමාරෝපය නම් වේ.

නාට්‍ය පෙළක් ප්‍රබලවීමට අවශ්‍ය වන්නේ,
(1) ගැටුම් අවස්ථා සහිත වීමය. (2) රංග විධාන සහිත වීමය.
(3) බොහෝ නාට්‍ය ගීත ඇතුළත් කර තිබීමය. (4) ආනුෂංගික ශිල්පීන්ට අවශ්‍ය ඉඩ ලබා දීමය.

නෘත්‍ය කණ්ඩායමට අයත් වන්නේ,
(1) ශුද්ධ මාත්‍රා, ලී කෙළි හා තෙල්මේ ය. (2) මණිපුරි, යක්ෂගාන හා කථක් ය.
(3) භරත නාට්‍යම්හි රාධා කෘෂ්ණා හා ශිව පාර්වතිය. (4) කළගෙඩි, පන්තේරු හා කුළු නැටුම්ය.

නාට්‍ය සංගීතය හා නාට්‍ය ගීත අයත්වන අභිනය පිළිවෙලින්,
(1) වාචික අභිනය හා ආහාර්ය අභිනයයි. (2) සාත්වික අභිනය හා ආංගික අභිනයයි.
(3) වාචික අභිනය හා සාත්වික අභිනයයි. (4) ආහාර්ය අභිනය හා වාචික අභිනයයි.

නාට්‍ය කලාව අනෙකුත් කලාවන්ගෙන් වෙනස් වන්නේ,
(1) සතර අභිනය රංගනය සඳහා යොදා ගන්නා බැවිනි.
(2) රංගාලෝකය සහ පසුතල දර්ශන යොදා ගන්නා බැවිනි.
(3) රංගාලෝකය සහ ගගනිකාව යොදා ගන්නා බැවිනි.
(4) පසුතල දර්ශන සඳහා චිත්‍ර වස්ත්‍ර යොදා ගන්නා බැවිනි,

පහතරට සම්ප්‍රදායට අයත් ශාන්තිකර්මයක් වන්නේ,
(1) රිද්දියාගය (2) කොහොඹාකංකාරිය (3) වලියක් මංගල්‍ය (4) පහන් මඩුව

නෘත්‍ය යනු,
(1) අංග වික්ෂේප පමණක් ඇති රිද්මයානුකූල නැටුමකි.
(2) කිසියම් අර්ථයක් දැක්වෙන තාලාන්විත නැටුමකි.
(3) අංග වික්ෂේප පමණක් ඇති තාලාන්විත නැටුමකි.
(4) කිසියම් කතා පුවතක් නිරූපනය කරන රඟුම් ප්‍රභේදයකි.

නාට්‍යමය අවස්ථාවක් ලෙස සැලකෙන්නේ,
(1) නාට්‍යයේ ජවනිකා අවසන් වන අවස්ථාවය. (2) නාට්‍යමය ගුණයෙන් පූර්ණ අවස්ථාවය.
(3) නාට්‍යයක් අවසන් වන අවස්ථාවය. (4) නාට්‍යයක් ආරම්භ වන අවස්ථාවය.

නාට්‍යයක ප්‍රධාන අරමුණ වන්නේ,
(1) මනා රූපයයි. (2) කතන්දරයයි. (3) රසෝත්පාදනයයි. (4) උපදේශනයයි.

නළුවෙකු සතුව තිබිය යුතු ගුණාංග හා ලක්ෂණ අතරට අයත් නොවන්නේ,
(1) සහජ හැකියාවය. (2) සබකෝලය දුරු කළ තැනැත්තෙකු වීමය.
(3) සුන්දර රූසපුවක් තිබීමය. (4) මනා ධාරණ ශක්තියක් තිබීමය.



දකුණු පස ඡායාරූපයෙන් දැක්වෙන්නේ,
(1) නෘත්තයකි. (2) නෘත්‍යයකි.
(3) නාට්‍යයකි. (4) අභිරූපණයකි.

PAST PAPERS WIKI
සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

Past Papers Wiki

Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

50 | S | II

කාලය : පැය 2
Time: 2 hours

Grade 10 – First Term Test – July 2023
පළමු වාර පරීක්ෂණය - 2023 ජූලි - 10 ශ්‍රේණිය

නාට්‍ය හා රංග කලාව - II

Name: - ..... Class: -..... Index no: - .....

• පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. පහත ඡායාරූපය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(i) ඉහත ඡායාරූපයෙන් දැක්වෙන නාට්‍යකරුවා කවුද ? (ල. 2)
(ii) ඔහු විසින් රචනා කරන ලද ස්වතන්ත්‍ර නාට්‍ය දෙකක් ලියා දක්වන්න. (ල. 2)
(iii) ඔහු විසින් ලියන ලද පරිවර්තන නාට්‍ය දෙකක් ලියා දක්වන්න. (ල. 2)
(iv) ඔහු රංගනයේ යෙදුනු වඩාත් ජනප්‍රිය නාට්‍යයක නමක් ලියා දක්වන්න. (ල. 2)
(v) එහි ඔහු රඟපෑ චරිතයේ නම කුමක්ද ? (ල. 2)
(vi) ඉතිහාසයේ එන කතා පුවතක් මුල්කරගෙන නව අර්ථකථනයක් හා නව දෘෂ්ටියකින් පිළිබිඹු වන අයුරින් ඔහු විසින් ඉතා විශිෂ්ට ගනයේ නාට්‍යයක් රචනා කරන ලදී. එම නාට්‍යයේ නම කුමක්ද ? (ල. 2)

(මුළු ලකුණු 12)

02. (i) අභිනය යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න. (ල. 2)
(ii) සතර අභිනය නම් කර ඒ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ල. 4)
(iii) රූපනය අර්ථවත් වීම පිණිස නළුවාට සතර අභිනය උපයෝගී වන අයුරු පහදන්න. (ල. 6)

(මුළු ලකුණු 12)

03. (i) රංග අභ්‍යාස යනු කුමක්ද ? (ල. 2)
(ii) රංග අභ්‍යාස වර්ග 4 ක් නම් කරන්න. (ල. 4)
(iii) නළුවෙකුට රංග අභ්‍යාස වැදගත් වන්නේ කවර හෙයින්දැයි පැහැදිලි කරන්න. (ල. 6)

(මුළු ලකුණු 12)

CamScanner

04.



(i) මෙම රූපයේ දැක්වෙන ශාන්තිකර්මය නම් කරන්න. (ලකු 2)

(ii) එම ශාන්තිකර්මයේ ඇතුළත් නාට්‍යමය පෙළපාලි 4ක් නම් කරන්න. (ලකු 4)

(iii) එම නම් කරන ලද නාට්‍යමය පෙළපාලි වලින් එකක් තෝරාගෙන, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න. (ලකු 6)

(මුළු ලකුණු 12)

05. (i) නෘත්ත යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද ? (ලකු 2)

(ii) නෘත්ත හා නෘත්‍යයේ සමානතා දෙකක් හා අසමානතා දෙකක් ලියා දක්වන්න. (ලකු 4)

(iii) නෘත්ත හා නෘත්‍යයට වඩා වේදිකා නාට්‍යයේ ඇති සුවිශේෂීතාවය සාකච්ඡා කරන්න. (ලකු 6)

(මුළු ලකුණු 12)

06. (i) නාට්‍ය ශෛලිය යනු කුමක්ද ? (ලකු 2)

(ii) ප්‍රධාන නාට්‍ය ශෛලීන් නම් කර කෙටියෙන් හඳුන්වන්න. (ලකු 4)

(iii) එම නාට්‍ය ශෛලීන්හි වෙනස්කම් සතර අභිනය ඇසුරින් දක්වන්න. (ලකු 6)

(මුළු ලකුණු 12)

07. පහත දැක්වෙන කතා සැකිල්ල ඔබ කැමති අවසානයක් කරා ගෙන යමින් කෙටි නාට්‍ය පෙළක් රචනා කරන්න.

තරිඳු දහම් පාසල් යන ගුණයහපත් ළමයෙකි. රවිඳු අනවශ්‍ය දෙයට මුදල් වියදම් කරන හිතුවක්කාර ළමයෙකි. මිතුරන් වන මේ දෙදෙනා පාසල් ඇරී නිවසට එන විට මුදල් පසුබිම්බියක් අහුලා ගනිති. මුදල් පසුම්බියට කළ යුත්තේ කුමක්දැයි දෙදෙනා අතර වාදයක් හටගනී. ඒ අතර එතනට පොලිස් නිලධාරියෙක් පැමිණෙයි .....

(i) පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමඟ සංවාද රචනා කිරීම සඳහා (ලකු 4)

(ii) චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා (ලකු 4)

(iii) කුතුහලය දනවන නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකු 4)

(මුළු ලකුණු 12)

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner